ඩී.එස්. සේනානායක විද්‍යාලය, කොළඹ 07.

ඩී.එස්. සේනානායක විද්‍යාලය, කොළඹ 07.

D.S. Senanayake College, Colombo 07.

තුන්වන වාර ඇගයීම -2016

Third Term Test - 2016

12 ශ්‍රේණිය -

Grade 12

# ආර්ථික විද්‍යාව - I පත්‍රය

# Economics - I

පැය දෙකයි.

Two hours

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

(01) සූක්ෂම ආර්ථික සංකල්පයක් මත පදනම් වන අභිමතානුසාරී ප්‍රකාශය තෝරන්න.

(1) සම්පත් පූර්ණ ලෙස නිෂ්පාදන ක්‍රියාවලියේ යොදා නොගනී නම් පූර්ණ සේවා නියුක්තිය ලඟාකර ගත නොහැකි වේ.

(2) හොඳම විකල්පය පිළිබඳ පරීක්ෂාවෙන් බලා ආවස්ථික පිරිවැය තීරණය කළ යුතුය.

(3) 5% ක් ඉක්මවා ඇති ආර්ථික වර්ධන වේගයක් යම් රටකට විදේශ සම්පත් ඒකරාශි කිරීමට අවස්ථාව ලබා දෙයි.

(4) ශුභ සාධක භාණ්ඩ සැපයීම සඳහා පුද්ගලික අංශය දායක කර ගැනීම එකී භාණ්ඩ වල ගුණත්වය විනාශ වීමට හේතුවිය හැක.

(5) වතු අංශයේ ආර්ථික සංවර්ධනය පිළිබඳ අවබෝධය ලබා ගැනීමට එකී අංශයේ ඒක පුද්ගල ආදායම වැදගත් වේ.

(02) ලෝකයේ ඕනෑම ආර්ථිකයක් තේරීමේ ගැටළුවට මුහුණදෙයි. තේරීම සම්බන්ධයෙන් ඔබ එකඟ නොවන ප්‍රකාශය කුමක් ද?

(1) ආර්ථික විද්‍යාව තේරීමේ විද්‍යාවක් ලෙස හැඳින්වේ.

(2) තේරීම යනු මූලික ආර්ථික ප්‍රශ්නය යි.

(3) තේරීම පිළිබඳ ප්‍රශ්නය ඇති වන්නේ හුදෙක්ම සම්පත්වල හිඟකම නිසා ය.

(4) තේරීමේ ගැටළුවට දුප්පත් මෙන්ම ධනවත් රටවල් ද මුහුණදෙයි.

(5) තේරීම නිසා ආවස්ථික පිරිවැයක් හට ගනී.

(03) ප්‍රතිෂ්ඨාපනය කළ හැකි සහ ප්‍රතිෂ්ඨාපනය කළ නොහැකි සම්පත් අතර පවතින වෙනස වඩාත් හොඳින් විස්තර වන්නේ කිනම් පිළිතුර මගින් ද?

(1) ප්‍රතිෂ්ඨාපනය කළ හැකි සම්පත් වලට සාපේක්ෂව ප්‍රතිෂ්ඨාපනය කළ නොහැකි සම්පත් හිඟවීම මගින් ය.

(2) ප්‍රතිෂ්ඨාපනය කළ හැකි සම්පත් භාවිතයත් සමග ක්ෂය වීම හා ප්‍රතිෂ්ඨාපනය කළ නොහැකි සම්පත් භාවිතයත් සමග ක්ෂය නොවීම නිසාත් ය.

(3) ප්‍රතිෂ්ඨාපනය කළ හැකි සම්පත් අජීවී වන අතර ප්‍රතිෂ්ඨාපනය කළ නොහැකි සම්පත් සජීවී වීම නිසා ය.

(4) ප්‍රතිෂ්ඨාපනය කළ හැකි සම්පත් සම්බන්ධයෙන් සීමාකම් පවතින අතර, ප්‍රතිෂ්ඨාපනය කළ නොහැකි සම්පත් සම්බන්ධයෙන් සීමාකම් දක්නට නොලැබීම මගින් ය.

(5) ප්‍රතිෂ්ඨාපනය කළ හැකි සම්පත්වලට සාපේක්ෂව ප්‍රතිෂ්ඨාපනය කළ නොහැකි සම්පත් සම්බන්ධයෙන් සැලසුම් ආර්ථික වඩාත් ප්‍රබලව මැදිහත් වීම මගින් ය.

(04) නිෂ්පාදන හැකියා මායිමට ඇතුළතින් පිහිටි ලක්ෂ්‍යයක්,

(1) සේවා වියුක්ති සම්පත් කිසියම් ප්‍රමාණයක් පවතින බව පෙන්වයි.
(2) අත්කර ගැනීම අපහසු වේ.
(3) නිෂ්පාදන හැකියා වක්‍රය මත පිහිටි ලක්ෂ්‍යයන්ට වඩා යහපත් වේ.
(4) සම්පත් පූර්ණ වශයෙන් සේවා නියුක්ත බව හඟවයි.
(5) ආවස්ථික පිරිවැය පිළිබඳ අදහස පෙන්නුම් කරයි.

(05) නිදහස් වෙළඳපොළ ආර්ථිකයක මිල යාන්ත්‍රණයේ කාර්යයන්ට අදාළව වඩාත් නිවැරදි ප්‍රකාශය වන්නේ පහත ප්‍රකාශ වලින් කවරෙක්ද?

(1) මිල ස්ථායිතාවය සහතික කරයි.
(2) වෙළඳපොළ මිල ඉහළ යෑමට සැලැස්වීමෙන් කිසියම් භාණ්ඩයක සැපයුම් අතිරික්තය ඉවත් කරයි.
(3) මිල ගණන් පහත වැටීම නිෂ්පාදන ආයතන වෙළඳපොළට ප්‍රවේශ වීම දිරිමත් කරයි.
(4) නිෂ්පාදන ඉලක්ක තීරණය කිරීමට ආණ්ඩුව මිල යාන්ත්‍රණය උපයෝගී කර ගනී.
(5) මිල යන්ත්‍රණය සලාකන උපකරණයක් ලෙස ක්‍රියා කරයි.

(06) ආර්ථික විද්‍යාවේ කේන්ද්‍රීය ප්‍රශ්නයට හේතු වන සාධකයක් නොවන්නේ,

(1) ස්වභාව ධර්මයෙන් ලබා දී ඇත්තේ සීමිත සම්පත් ප්‍රමාණය කි.
(2) සමාජය තුළ නිරන්තරයෙන් වැඩිවන මිනිස් වුවමනා පවතී.
(3) සමහර සම්පත් ප්‍රතිෂ්ඨාපනය කළ නොහැකි වේ.
(4) ආර්ථික තේරීම් කිරීමේ දී මිනිසාට ආවස්ථික පිරිවැයක් දැරීමට සිදුවේ.
(5) පවත්නා සම්පත් ක්ෂය වන වේගයට වඩා වැඩි වේගයකින් නව සම්පත් සොයා නොගැනේ.

(07) රටක නිෂ්පාදන හැකියාව වැඩි කිරීම සඳහා හේතුවිය හැක්කේ,

(1) සේවා වියුක්තියේ අඩුවීමක්
(2) රජයේ පාරිභෝජන වියදම් ඉහළ යෑම.
(3) දේශීය ඉතුරුම් වඩා ඉහළ යෑමක්
(4) රාජ්‍ය අංශය සඳහා රැකියා විරහිත උපාධිධාරීන් බඳවා ගැනීම.
(5) ශුද්ධ දේශීය ප්‍රාග්ධන සම්පාදනය ඉහළ යෑම.

(08) ආර්ථික සම්පත් බෙදා වෙන් කිරීම සඳහා මිල යන්ත්‍රණය යොදාගත් විට වෙළඳපොළ මිල ගණන්,

(1) ඉහළ යා යුතුය.
(2) සාමාන්‍යයෙන් රජයේ නියාමනයට ලක් කෙරේ.
(3) මුළුමනින්ම නිෂ්පාදන පිරිවැය මතම තීරණය වේ.
(4) ඉල්ලුම වෙනස්වීම කෙරෙහි ප්‍රතිචාර නොදක්වයි.
(5) ඉල්ලුම් හා සැපයුම් ප්‍රමාණ පිළිබඳ සංඥා නිෂ්පාදකයින්ට ලබා දේ.

(09) ආර්ථිකයක සම්පත් අධි උපයෝජනය වුවහොත්,

(1) එම ආර්ථිකයේ පොදු මිල මට්ටම ස්ථාවර වේ.
(2) නිෂ්පාදන ශක්‍යතාවයේ වැඩිවීමක් සිදුවේ.
(3) නිෂ්පාදන පිරිවැය අඩුවී මිල මට්ටම පහත වැටේ.
(4) නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයට ඇතුළතින් සත්‍ය නිමැවුම තීරණය වේ.
(5) ධන නිමැවුම් පරතරයක් ඇතිවේ.

(10) නිදහස් වෙළඳපොළ ආර්ථිකයක පාරිභෝගික ස්වාධිපත්‍ය හටගනුයේ කිනම් අවස්ථාවකදී ද?

(1) වෙළඳපොළෙහි තේරීමට අවස්ථාවක් ඇතිවිටදී ය.

(2) පාරිභෝගිකයා විසින් භාණ්ඩයක් සඳහා ගෙවීමට කැමති මිලට වඩා අඩු මිලක් ගෙවනු ලබන විටකදී ය.

(3) භාණ්ඩය පිළිබඳ ප්‍රචාරණයක් වෙළඳපොළේ නොමැති විටකදී ය.

(4) වෙළඳපොළේ ඉල්ලුම හා සැපයුම සමාන වන විටකදී ය.

(5) කුමක් නිෂ්පාදනය කළ යුතු ද යන්න පාරිභෝගික ඉල්ලුම විසින් තීරණය කරනු ලබන විටකදී ය.

(11) භාණ්ඩ හා සේවා මිල ගණන් සහ සාධක සේවා මිල ගණන් රජය මගින් තීරණය කිරීම තුළින් මධ්‍යගත සැලසුම් ආර්ථික ක්‍රමයක් බලාපොරොත්තු වන්නේ,

(1) නිෂ්පාදන ආයතන උපයන අතිරික්ත ලාභ පාලනය කිරීම යි.

(2) විකල්ප අතර කාර්යක්ෂම ලෙස සම්පත් බෙදා හැරීම යි.

(3) විකල්ප නිෂ්පාදන අතර සම්පත් බෙදා හැරීම සඳහා කුටුම්භ වෙත මග පෙන්වීම යි.

(4) නිෂ්පාදිත භාණ්ඩ හා සේවා කුටුම්භ අතර කෙසේ බෙදා හැරිය යුතු දැයි තීරණය කිරීම යි.

(5) තමන් කැමති පරිදි නිෂ්පාදන ශිල්ප ක්‍රම තෝරා ගැනීමට ව්‍යාපාර ආයතන වලට ඉඩ ප්‍රස්ථා ලබා දීම යි.

(12) සමාජයීය වෙළඳපොළ ආර්ථික ක්‍රමයක පහත සඳහන් ලක්ෂණ වලින් කවරක් දැකිය නොහැකි වේද?

(1) වයස්ගත හා රැකියා විරහිත පුද්ගලයින්ගේ අභිවෘද්ධිය සඳහා අවධානය යොමු කිරීම.


(2) ලාභ මත පදනම් වූ මිල ක්‍රමය

(3) පුද්ගලික අංශය වෙතැති සම්පත් අයිතිය

(4) ආර්ථික තීරණ වඩා නිවැරදි කිරීම සඳහා මධ්‍යගත සැලසුම්කරණය යි.

(5) ආදායම් ව්‍යාප්තියේ විෂමතාවය

(13) එක්තරා ආර්ථිකයක සම්පත් භාවිතා කරන විවිධ ආකාර පහත ප්‍රස්ථාර සටහනේ දැක්වේ. ඉහත ප්‍රස්ථාර සටහනට අනුව ආර්ථික පසු බැසීමක දී නිමැවුම් සංයෝගය,




(1) A සිට B දක්වා විතැන් වේ.


(2) B සිට D දක්වා විතැන් වේ.

(3) E සිට D දක්වා විතැන් වේ.

(4) D සිට C දක්වා විතැන් වේ.

(5) C සිට A දක්වා විතැන් වේ.

(14) තිරිඟු සහ තේ නිෂ්පාදනය කරන ආර්ථිකයක් සම්බන්ධයෙන් පහත නිෂ්පාදන හැකියා මායිම ඔබට සපයා ඇත. එම නිෂ්පාදන හැකියා මායිමට අනුව C ලක්ෂ්‍යයේ සිට D ලක්ෂ්‍යයට ගමන් කිරීමට හේතු වූයේ,




(1) තේ සහ තිරිඟු නිෂ්පාදනයේ අකාර්යක්ෂමතාවයක් ඇතිවීම නිසා ය.


(2) කර්මාන්ත දෙකෙහිම නිෂ්පාදනය වැඩිවීමෙ නිසා ය.

(3) තිරිඟු නිෂ්පාදනයට හොඳ අස්වැන්නක් ලබාදෙන බීජ වර්ග හඳුන්වාදීමෙන් පසුව තිරිඟු නිෂ්පාදනයේ ඉහළ නිසා ය.

(4) තිරිඟු නිෂ්පාදනයේ ඵලදායිතාවය වැඩිවුවත්, එය තේ නිෂ්පාදනය වැඩිවීම සඳහා බලපා ඇති අවස්ථාව නිසා ය.

(5) තිරිඟු නිෂ්පාදනයේ තාක්ෂණික දියුණුවක් සිදුවීම නිසා එම අංශයේ විරැකියා තත්ත්වයක් ඇති වූ අතර, එමගින් තේ නිෂ්පාදනය සම්බන්ධයෙන් කිසිදු බලපෑමක් සිදු නොවීම නිසා ය.

(15) X හා Y සහ භාණ්ඩ දෙවර්ගය පමණක් නිපදවන ආර්ථිකයක නිෂ්පාදන හැකියා මායිම් වක්‍රය පහත දැක්වේ. ප්‍රස්ථාර සටහනේ A ලක්ෂ්‍යයෙන් දැක්වෙන්නේ ආර්ථිකයේ දැනට පවත්නා නිෂ්පාදන සංයෝගය යි. Y භාණ්ඩයෙහි ඒකක 20 ක් නිෂ්පාදනය කිරීමේ ආවස්ථික පිරිවැය කොපමණ ද?




(1) X භාණ්ඩ ඒකක 320 කි.

(2) X භාණ්ඩ ඒකක 32 කි.

(3) X භාණ්ඩ ඒකක 12 කි.

(4) Y භාණ්ඩ ඒකක 200 කි.

(5) X භාණ්ඩ ඒකක 200 කි.

(16) A භාණ්ඩයේ මිල ඉල්ලුම් නම්‍යතාවය - - 0.8 ක් ද

B භාණ්ඩයේ මිල ඉල්ලුම් නම්‍යතාවය - - 0.4 ක් ද

(1) මිල වැඩිවීමේදී නිෂ්පාදක අයභාරය භාණ්ඩ දෙකේම අඩු වේ.


(2) මිල අඩුවීමේ දී භාණ්ඩ දෙකේම නිෂ්පාදක අයභාරය වැඩි වේ.

(3) මිල වැඩිවීමේ දී A භාණ්ඩයේ නිෂ්පාදක අයභාරය වැඩිවන අතර, B භාණ්ඩයේ පාරිභෝගික පැහැදම වැඩි වේ.

(4) මිල අඩුවීමක දී A භාණ්ඩයේ නිෂ්පාදක අයභාරය නොවෙනස්ව පවතින අතර, B භාණ්ඩයේ නිෂ්පාදක අයභාරය අඩුවේ.

(5) මිල අඩුවීමක දී නිෂ්පාදක අයභාරයට කුමක්දැයි නිශ්චිතව පැවසිය නොහැක.

(17) මෙම ප්‍රස්ථාර සටහනේ ඇති D හා $D_1$ යන ඉල්ලුම් වක්‍ර දෙකේ P මිලට අදාළ A හා B යන ලක්ෂ්‍ය වල මිල ඉල්ලුම් නම්‍යතාවය පිළිබඳ නිවැරදි ප්‍රකාශය තෝරන්න.




(1) ඉල්ලුම් වක්‍ර දෙකේම බෑවුම සමාන වන බැවින් මිල ඉල්ලුම් නම්‍යතාවය සමාන වේ.

(2) ඉල්ලුම් වක්‍ර දෙකේම බෑවුම සමාන වුවද A ලක්ෂ්‍යයට සාපේක්ෂව B ලක්ෂ්‍යයේ මිල ඉල්ලුම් නම්‍යතාවය අඩු වේ.

(3) ඉල්ලුම් වක්‍ර දෙකේ බෑවුම අසමාන වන බැවින් A ලක්ෂ්‍යයට සාපේක්ෂව B ලක්ෂ්‍යයේ මිල ඉල්ලුම් නම්‍යතාවය අඩු වේ.

(4) ඉල්ලුම් වක්‍ර දෙකේම බෑවුම සමාන වන බැවින් A ලක්ෂ්‍යයට සාපේක්ෂව B ලක්ෂ්‍යයේ මිල ඉල්ලුම් නම්‍යතාවය වැඩි වේ.

(5) A ලක්ෂ්‍යයේ මිල ඉල්ලුම් නම්‍යතාවය අපිරිමිත අගයක් ගන්නා අතර B ලක්ෂ්‍යයේ මිල ඉල්ලුම් නම්‍යතාවය ඒකීය වේ.

(18) භාණ්ඩයක මිල ඉහළ යන විට එම භාණ්ඩය සඳහා කෙරෙන මුළු පාරිභෝගික පැහැදම අඩුවිය. මෙවැන්නක් සිදුවිය හැක්කේ කුමන අවස්ථාවකදී ද?

(1) භාණ්ඩයට ඉතා සමීප ආදේශන පවතින විට

(2) භාණ්ඩයට ඉතා අනම්‍ය වූ ඉල්ලුමක් පවතින විට

(3) භාණ්ඩය බාල භාණ්ඩයක් වූ විට

(4) භාණ්ඩයට ඒකීය මිල ඉල්ලුම් නම්‍යතාවයක් පවතින විට

(5) භාණ්ඩයට සමීප ආදේශන හිඟවීම.

(19) කිසියම් භාණ්ඩයක ඉල්ලුම් වක්‍රය දිගේ පහළට ගමන් කිරීමක් වෙනත් භාණ්ඩයක මිල අඩුවීමට බලපායි. මෙම භාණ්ඩ දෙවර්ගය,

(1) අනුපූරක භාණ්ඩ වේ. (2) ආදේශන භාණ්ඩ වේ.

(3) බාල භාණ්ඩ වේ. (4) නිෂ්පාදන අනුපූරක වේ.

(5) ගිෆන් භාණ්ඩ වේ.

(20) පහත සඳහන් දෑ අතුරින් ඉල්ලුම් න්‍යාය ගම්‍ය වන ප්‍රකාශය තෝරන්න.

(1) ඉල්ලුම තීරණය කරන අනෙකුත් සාධක ස්ථාවරව පවතී නම් සලකා බලන භාණ්ඩයේ මිල හා ඉල්ලුම් ප්‍රමාණය අතර ප්‍රතිලෝම සම්බන්ධතාවයක් පවතී.


(2) මිල වෙනස්වීමක ආදේශන හා ආදායම් ප්‍රතිවිපාකය ඉල්ලුම් න්‍යායට හේතු වේ.

(3) $Qd_x = F(P_x)$

(4) මිල ස්ථාවරව පැවතිය දී ඉල්ලුම තීරණය කරන අනෙකුත් සාධක හා ඉල්ලුම අතර සම්බන්ධය ඉල්ලුම් න්‍යාය යි.

(5) $Qd_x = F(P_x, P_1......, N, Y, T, E, N, O)$

(21) පහත දැක්වෙන ප්‍රස්ථාර සටහනේ කිසියම් පාරිභෝගික භාණ්ඩයක් සඳහා ඇති වෙළඳපොළ සමතුලිතය නිරූපණය කරයි.




මෙම භාණ්ඩයක් සඳහා නිෂ්පාදන සහනාධාරයක් ලබාදීමට රජය තිරණය කරනු ලැබුව හොත් එමගින් වාසි ලැබෙන්නේ,

(1) පාරිභෝගිකයින් පමණි.
(2) නිෂ්පාදකයින් පමණි.
(3) පාරිභෝගිකයින් හා නිෂ්පාදකයින් එක සමාන ලෙස ය.
(4) නිෂ්පාදකයින්ට වඩා පාරිභෝගිකයින් ය.
(5) පාරිභෝගිකයින්ට වඩා නිෂ්පාදකයින් ය.

(22) X භාණ්ඩයේ ඒකකය මිල රු. 10 සිට රු. 9 දක්වා අඩුවූ විට Y භාණ්ඩය සඳහා ඇති ඉල්ලුම ඒකක 20 සිට 25 දක්වා වැඩි වේ.

(1) X මිලට සාපේක්ෂව Y භාණ්ඩයේ හරස් ඉල්ලුම් නම්‍යතාවය 5.2 ක් වන අතර, X හා Y අනුපූරක භාණ්ඩ වේ.
(2) X මිලට සාපේක්ෂව Y භාණ්ඩයේ හරස් ඉල්ලුම් නම්‍යතාවය -2.5 ක් වන අතර X හා Y අනුපූරක භාණ්ඩ වේ.
(3) X මිලට සාපේක්ෂව Y භාණ්ඩයේ හරස් ඉල්ලුම් නම්‍යතාවය -2.5 ක් වන අතර X හා Y ආදේශන භාණ්ඩ වේ.
(4) X මිලට සාපේක්ෂව Y භාණ්ඩයේ හරස් ඉල්ලුම් නම්‍යතාවය +2.5 ක් වන අතර X හා Y අනුපූරක භාණ්ඩ වේ.
(5) X මිලට සාපේක්ෂව Y භාණ්ඩයේ හරස් ඉල්ලුම් නම්‍යතාවය +2.5 ක් වන අතර X හා Y ආදේශන භාණ්ඩ වේ.

The National e-learning Portal for The General Education

(23) කිසියම් භාණ්ඩයක් තරගකාරී වෙළඳපොළක විවිධ මිල යටතේ සැපයෙන ප්‍රමාණ පිළිබඳ දත්ත පහත වගුවේ දක්වා ඇත.

| මිල (රු.) | 2 | 3 | 4 | 5 | 6 | 7 |
|---|---|---|---|---|---|---|
| සැපයුම් ප්‍රමාණය (ඒකක) | 0 | 5 | 9 | 12 | 14 | 15 |

මෙම භාණ්ඩයේ අලෙවිය මත ඒකකයක් සඳහා රු.2 ක බද්දක් පැනවුවහොත් බද්දෙන් පසු සැපයුම් ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| A | B | C | D | E | F |
|---|---|---|---|---|---|
| මිල | සැපයුම් ප්‍රමාණය | සැපයුම් ප්‍රමාණය | සැපයුම් ප්‍රමාණය | සැපයුම් ප්‍රමාණය | සැපයුම් ප්‍රමාණය |
| 2 | 0 | 0 | 0 | 0 | 0 |
| 3 | 5 | 0 | 3 | 0 | 7 |
| 4 | 9 | 0 | 7 | 0 | 11 |
| 5 | 12 | 5 | 10 | 9 | 14 |
| 6 | 14 | 9 | 12 | 12 | 16 |
| 7 | 15 | 12 | 13 | 14 | 17 |

බද්දෙන් පසු නිවැරදි සැපයුම් ලේඛනය වන්නේ,

(1) A B (2) AC (3) AD (4) AE (5) AF

(24) මිල (රු.) ඉල්ලුම් ප්‍රමාණය (ඒකක)

| | |
|---|---|
| 1.00 | 6000 |
| 1.50 | 3000 |

මෙම භාණ්ඩයේ මිල රු. 1.00 සිට රු. 1.50 දක්වා වැඩිවන විට මිල ඉල්ලුම් නම්‍යතාවය,

(1) ඒකීය වේ. (2) එකට අඩු වේ.
(3) එකට වැඩි වේ. (4) ශුන්‍ය වේ.
(5) අපිරිමිත වේ.

(25) පහත දැක්වෙන ප්‍රකාශ අතුරින් සාවද්‍ය ප්‍රකාශය තෝරන්න.

(1) සමතුලිත හුවමාරුවේ දී හට ගන්නා ආර්ථික අතිරික්තය තරගකාරී වෙළඳපොළක කාර්යක්ෂමතාවය නිරූපණය කෙරෙන මිනුම කි.
(2) භාණ්ඩයක මිල වැඩි වන විට එම භාණ්ඩය මත කෙරෙහි මුළු පාරිභෝගික පැහැදම මිල වැඩි වූ ප්‍රතිශතයෙන්ම වැඩිවූයේ නම් එම භාණ්ඩයට ඇත්තේ පූර්ණ අනම්‍ය ඉල්ලුම කි.
(3) මිල ඉල්ලුම් නම්‍යතාවයේ ප්‍රමාණාත්මක අගය සහ භාණ්ඩයක් මත පනවනු ලබන බද්දකින් පාරිභෝගිකයින්ට ඉසිලීමට සිදුවන සාපේක්ෂ බදු බර අතර පවතින්නේ අනුලෝම සම්බන්ධතාවය කි.
(4) ඒකාධිකාරී වෙළඳපොළක පමණක් ආයතනය හා කර්මාන්තය අතර වෙනසක් නොපවතී.
(5) ඉල්ලුම් ලේඛනයක හෝ ඉල්ලුම් වක්‍රයක එක් ලක්ෂ්‍යයකින් ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණය දැක්වේ.

(26) පහත සඳහන් තොරතුරු ඔබට සපයා ඇත.

- කුකුල් මස් වල ආදායම් ඉල්ලුම් නම්‍යතා සංගුණකය -0.5
- මාළු මිල සමග කුකුල් මස් වල හරස් ඉල්ලුම් නම්‍යතා සංගුණකය +0.6
- හරක් මස් මිල සමග කුකුල් මස් වල හරස් ඉල්ලුම් නම්‍යතා සංගුණකය +1.5


ඉහත සඳහන් ආකාරයට කුකුල් මස් වල නම්‍යතා අගයන් තීරණය වීම සඳහා බලපා ඇති හේතුව විය හැක්කේ,

(1) කුකුල් මස් අත්‍යවශ්‍ය භාණ්ඩයක් වීම හා මාළු සහ කුකුල් මස් කිට්ටු ආදේශක ද, හරක් මස් සහ කුකුල් මස් දුරස්ථ ආදේශ ද වීම යි.
(2) කුකුල් මස් අත්‍යවශ්‍ය භාණ්ඩයක් වීම හා කුකුල් මස් සහ මාළු දුරස්ථ ආදේශකයක් ද, කුකුල් මස් සහ හරක් මස් සමීප ආදේශකයක් ද වීම යි.
(3) කුකුල් මස් සාමාන්‍ය භාණ්ඩයක් වන අතර හරක් මස් සමග සමීප ආදේශකයක් වීම යි.
(4) කුකුල් මස් බාල භාණ්ඩයක් වන අතර මාළු හා කුකුල් මස් සමීප ආදේශයක් ද, හරක් මස් හා කුකුල් මස් දුරස්ථ ආදේශකයක් ද වීම යි.
(5) කුකුල් මස් බාල භාණ්ඩයක් වන අතර, කුකුල් මස් හා මාළු දුරස්ථ ආදේශයක් ද, කුකුල් මස් හා හරක් මස් සමීප ආදේශයක් ද වීම යි.

(27) පහත ප්‍රස්ථාර සටහනේ දැක්වෙන වෙනස හේතු කොටගෙන ආර්ථික අතිරික්තය වෙනස් වන්නේ,

ආර්ථික අතිරික්තය

(1) C + D + E + F වලින් අඩු වේ.
(2) D+ F වලින් අඩු වේ.
(3) B + C + D වලින් අඩු වේ.
(4) E + F වලින් අඩු වේ.
(5) B + C + E වලින් අඩු වේ.



(28) කිසියම් භාණ්ඩයක් සඳහා වෙළඳපොළ ඉල්ලුම් හා සැපයුම් ලේඛනවලට අදාළ දත්ත සමහරක් පහත දැක්වේ.

| මිල (රු.) | ඉල්ලුම් ප්‍රමාණය (ඒකක) | සැපයුම් ප්‍රමාණය (ඒකක) |
|---|---|---|
| 4 | 84 | 12 |
| 8 | 68 | 44 |


රජයේ මෙම භාණ්ඩයේ ඒකකයක් මත රු. 3 ක විශේෂිත බද්දක් පනවන්නේ යැයි සිතන්න.

| | බද්දට පෙර ඉල්ලුම් සමීකෂණය | බද්දට පසු ඉල්ලුම් සමීකරණය | බද්දට පෙර සැපයුම් සමීකරණය | බද්දට පසු සැපයුම් සමීකරණය |
|---|---|---|---|---|
| (1) | Qd = 100 - 4P | Qd = 88 - 4P | Qs = -20 + 8P | Qs = -20 + 4P |
| (2) | Qd = 100 - 2P | Qd = 100 - 4P | Qs = -44 + 8P | Qs = -20 + 8P |
| (3) | Qd = 100 - 4P | Qd = 100 - 4P | Qs = -20 + 8P | Qs = -44 + 8P |
| (4) | Qd = 84 - 4P | Qd = 100 - 2P | Qs = 20 + 8P | Qs = 44 + 8P |
| (5) | Qd = 68 - 4P | Qd = 84 - 4P | Qs = 120 + 8P | Qs = -44 + 8P |

(29) X භාණ්ඩයේ ඉල්ලුම් වක්‍රය සරල රේඛීය යැයි සිතන්න. භාණ්ඩයේ උපරිම ඉල්ලුම් මිල රු. 30 කි. මෙම භාණ්ඩයේ මිල රු. 20 ක් නම් මිල ඉල්ලුම් නම්‍යතාවය,

(1) 0.5 කි. (2) 2 කි. (3) 1. 5 කි. (4) 1 කි. (5) 2.5 කි.

(30) වෙළඳපොළ සැපයුම දේශිය නිෂ්පාදනයෙන් සහ ආනයන වලින් සමන්විත භාණ්ඩයක් පිළිබඳ තොරතුරු පහත සඳහන් ප්‍රස්ථාර සටහනේ දැක්වේ.




විදේශ විනිමය අනුපාතිකය ඇමෙරිකානු ඩොලර් එකක් රු. 80 කි.

| | භාණ්ඩයේ ලෝක වෙළඳපොළ මිල | තීරු බද්දට පසු ආනයනය කරන භාණ්ඩ ප්‍රමාණය | ආනයනය සඳහා වැයවන විදේශ විනිමය ප්‍රමාණය | රජයට ලැබෙන මුළු තීරු බදු ආදායම |
|---|---|---|---|---|
| (1) | ඩොලර් 1 කි. | ඒකක 4000 කි. | ඩොලර් 4000 කි. | රු. 160,000 කි. |
| (2) | ඩොලර් 0.5 කි. | ඒකක 2000 කි. | ඩොලර් 2000 කි. | රු. 80,000 කි. |
| (3) | ඩොලර් 0.5 කි. | ඒකක 2000 කි. | ඩොලර් 1000 කි. | රු. 80,000 කි. |
| (4) | ඩොලර් 4 කි. | ඒකක 1000 කි. | ඩොලර් 4000 කි. | රු. 40,000 කි. |
| (5) | ඩොලර් 2 කි. | ඒකක 5000 කි. | ඩොලර් 10000 කි. | රු. 200,000 කි. |

(31) සංවර්ධන ලොතරැයි සඳහා වෙළඳපොළ ඉල්ලුම් වක්‍රය Qd = 500 000 – 20 000 P සහ සැපයුම් වක්‍රය P = 20 නම් සමතුලිත අලෙවි ප්‍රමාණය වන්නේ,

(1) 100 000 (2) 40 000 (3) 90 000 (4) 480 000 (5) 200 000

(32) භාණ්ඩයක ඉල්ලුම් ශ්‍රිතය Qd = 20 - 2P මගින් දැක්වේ. අධි ඉල්ලුම් ශ්‍රිතය Qd = 30 – 6P වේ. සමතුලිතයේ දී පාරිභෝගික අතිරික්තය වන්නේ,

(1) රු. 25 (2) රු. 22.50 (3) රු. 12.50 (4) රු. 75 (5) රු. 24.50


(33) තරගකාරී වෙළඳපොළක සමතුලිත මිල ඉහළ යැමට පහත සඳහන් කවර තත්ත්වයක් හේතු වේද?

(1) සැපයුම පූර්ණ අනම්‍ය වීම හා ආදේශන භාණ්ඩ මිල පහත වැටීම.
(2) ඉල්ලුම පූර්ණ අනම්‍ය වීම හා ආයතන වල ශ්‍රම පිරිවැය ඉහළ යැම.
(3) සැපයුම පූර්ණ අනම්‍ය වීම හා අනුපූරක භාණ්ඩයක මිල ඉහළ යැම.
(4) ඉල්ලුම පූර්ණ නම්‍ය වීම හා ආයතනවල ශ්‍රම පිරිවැය ඉහළ යැම.
(5) ඉල්ලුම පූර්ණ අනම්‍ය වීම හා ආයතනවල ශ්‍රම පිරිවැ පහළ යැම.

(34) අනම්‍ය ඉල්ලුමක් පවතින භාණ්ඩයකට නිෂ්පාදන සහනාධාරයක් ලබාදුන් විට සිදුවන තත්ත්වය සම්බන්ධයෙන් ඔබ එකඟ නොවන ප්‍රකාශය කුමක් ද?

(1) පාරිභෝගිකයින්ට නිෂ්පාදන සහනාධාරයෙන් වැඩි වාසියක් හිමි වේ.
(2) නිෂ්පාදකයින්ගේ ආදායම ඉහළ යයි.
(3) පාරිභෝගිකයින්ගේ වියදම පහළ යයි.
(4) සහනාධාරයෙන් 50% කට වඩා අඩුවෙන් මිල පහළ යයි.
(5) පාරිභෝගික අතිරික්තය වැඩි වේ.

(35) පහත රූප සටහනේ දැක්වෙන සැපයුම් වක්‍රයෙහි මිල නම්‍යතාවය නිවැරදිව විස්තර කරනුයේ කවර ප්‍රකාශයක් මගින් ද?




(1) සියලුම නිමැවුම් ප්‍රමාණවලදී නම්‍යතාව 1 ට වැඩි වන අතර, එය නොවෙනස්ව පවතී.
(2) සියලුම නිමැවුම් ප්‍රමාණවලදී නම්‍යතාව 1 ට වඩා අඩුවන අතර එය නොවෙනස්ව පවතී.
(3) සියලුම නිමැවුම් ප්‍රමාණවලදී නම්‍යතාව 1 ට සමාන වේ.
(4) නිමැවුම වැඩිවන විට නම්‍යතාව අඩු වේ.
(5) නිමැවුම වැඩිවන විට නම්‍යතාව වැඩි වේ.

(36) හීනවන ඵල නිතිය වඩා නිවැරදිව විස්තර කෙරෙනුයේ පහත සඳහන් කවර ප්‍රකාශයක් මගින් ද?

(1) කිසියම් භාණ්ඩයක පාරිභෝජනය වැඩි කරන විට මුළු තෘප්තිය අඩුවන වේගයකින් ඉහළ යයි.
(2) ස්ථාවර සාධකයක් සමග විචල්‍ය සාධකයකින් වැඩි වැඩියෙන් යෙදීමේ දී මුළු නිෂ්පාදිතය අඩුවන වේගයකින් ඉහළ නගී.
(3) සියළුම සාධක සමානුපාතිකව වැඩි කරනු ලබන විට මුළු නිෂ්පාදිතය අඩුවන වේගයකින් ඉහළ යයි.
(4) ස්ථාවර සාධකයක් සමග විචල්‍ය සාධකයකින් වැඩි වැඩියෙන් යෙදවීමේ දී නිෂ්පාදනයේ ආන්තික පිරිවැය අඩු වේ.
(5) සියළුම සාධක සමානුපාතිකව වැඩි කරනු ලබන විට නිෂ්පාදනයේ ආන්තික පිරිවැය ඉහළ යයි.

(37) ආන්තික නිමැවුම ශුන්‍ය වූ විට,

(1) එම අවස්ථාවෙහි පසුව නිෂ්පාදනය වැඩි කිරීමට ඉඩක් නොමැත.

(2) සාමාන්‍ය නිමැවුම වැඩි වෙමින් පවතී.

(3) ආයතනයේ මුළු නිමැවුම උපරිම වේ.

(4) ස්ථාවර පිරිවැය ශුන්‍ය වේ.

(5) ස්ථාවර යෙදවුම් පූර්ණ ලෙස උපයෝජනය වේ.

(38) කිසියම් ආයතනයක නිමැවුම හා පිරිවැය පිළිබඳ පහත දැක්වෙන තොරතුරු ඔබට සපයා ඇත.

| නිමැවුම (ඒකක) Q | මුළු පිරිවැය (රු.) TC |
|---|---|
| 0 | 100 |
| 1 | 160 |
| 2 | 180 |
| 3 | 190 |
| 4 | 210 |

ඉහත ආයතනයේ සාමාන්‍ය ස්ථාවර පිරිවැය සම්බන්ධයෙන් ඔබට එකඟ විය හැකි නිවැරදි පිළිතුර දැක්වෙන ප්‍රකාශය කුමක් ද?

(1) නිමැවුම 0 දී සාමාන්‍ය ස්ථාවර පිරිවැය 0 කි.


(2) නිමැවුම ඒකක 2 දී සාමාන්‍ය ස්ථාවර පිරිවැය 50 කි.

(3) නිමැවුම ඒකක 4 දී සාමාන්‍ය ස්ථාවර පිරිවැය 60 කි.

(4) නිමැවුම ඒකක 3 දී සාමාන්‍ය ස්ථාවර පිරිවැය 100 කි.

(5) නිමැවුම ඒකක 4 දී සාමාන්‍ය ස්ථාවර පිරිවැය 110 කි.

(39) නිමැවුම ඒකක 25 ක් නිපදවනු ලබන තරගකාරී නිෂ්පාදන ආයතනයක පිරිවැය වක්‍ර පහත රූප සටහනේ පෙන්නුම් කෙරේ. ඒකක 25 ක් නිපදවීමේ දී ආයතනයේ මුළු විචල්‍ය පිරිවැය සහ මුළු පිරිවැය කොපමණ ද?




| | මුළු විචල්‍ය පිරිවැය | මුළු පිරිවැය |
|---|---|---|
| (1) | රු. 250 | රු. 300 |
| (2) | රු. 250 | රු. 375 |
| (3) | රු. 375 | රු. 500 |
| (4) | රු. 425 | රු. 550 |
| (5) | රු. 500 | රු. 625 |

(40) පූර්ණ තරඟකාරී වෙළඳපොළක ලක්ෂණයක් නොවන්නේ කුමක් ද?

(1) කර්මාන්තයේ ඉල්ලුම් වක්‍රය පහළට බෑවුම් වීම.

(2) එක් එක් ආයතනයේ ඉල්ලුම් වක්‍ර පූර්ණ නම්‍ය වීම.

(3) කර්මාන්තයේ මුළු සැපයුමෙහි ඉතා කුඩා ප්‍රතිශතයක් පමණක් සපයන ආයතන විශාල සංඛ්‍යාවක් තිබීම.

(4) එක් එක් ආයතනය විසින් තම නිපැයුම් ප්‍රමාණය තීරණය කිරීම.

(5) එක් එක් ආයතනයට තම භාණ්ඩ කෙරෙහි විශේෂ පාරිභෝගික ඇල්මක් ඇතිකරගත හැකි වීම.

(41) පූර්ණ තරඟකාරී වෙළඳපොළක් කටයුතු කරන නිෂ්පාදන ආයතනයක් සමතුලිතතාවයේ සිටින විට එහි සාමාන්‍ය අයභාරය,

(1) ආන්තික අයභාරයට වඩා අඩුවන අතර, එම අගයන් දෙකට ධන අගයක් ගනී.

(2) ආන්තික අයභාරයට සමාන වන අතර එම අගයන් දෙකම ශූන්‍ය අගයක් ගනී.

(3) ආන්තික අයභාරයට සමාන වන අතර, එම අගයන් දෙකම ධන අගයක් ගනී.

(4) ආන්තික අයභාරයට වඩා වැඩි වන අතර ආන්තික අයභාරයේ අගය ශූන්‍ය වේ.

(5) ආන්තික අයභාරයට වඩා වැඩිවන අතර, ආන්තික අයභාරය ධන අගයක් ගනී.

(42) ආයතනය හා කර්මාන්තය යන දෙකම එකක් ලෙස ක්‍රියාත්මක වන වෙළඳපොළ ව්‍යුහය කුමක් ද?

(1) පූර්ණ තරඟය (2) ඒකාධිකාරය (3) ඒකාධිකාරී තරගය

(4) කෘතිපයාධිකාරිය (5) අපූර්ණ තරගය

(43) ජාතික ගිණුම් යනුවෙන් අදහස් කරන්නේ,

(1) සියළු නිෂ්පාදන ඒකකවල වසර අවසානයේ ගිණුම්වල එකතුව යි.

(2) නිමැවුම්, ආදායම් හා වියදම් යන ප්‍රවේශ යොදාගෙන රටක සමස්ත නිෂ්පාදනයේ අගය ගණනය කර ඉදිරිපත් කිරීම යි.

(3) රටක ජාතික නිෂ්පාදිතය එකතු කළ අගය මගින් ද, අවසාන නිෂ්පාදිතය මගින් ද ඉදිරිපත් කිරීම යි.

(4) දේශීය නිෂ්පාදිතයට ශුද්ධ විදේශ සාධක ආදායම එකතු කිරීමෙන් ජාතික නිෂ්පාදිතයේ අගය ලබා ගැනීම යි.

(5) සමස්ත ආර්ථිකය පිළිබඳ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ගිණුම් කටයුතු පවත්වා ගැනීම යි.

(44) ජාතික නිෂ්පාදිතයේ අගය මැනීම සඳහා යොදා ගන්නා නිමැවුම්, ආදායම් හා වියදම් යන විකල්ප ප්‍රවේශ මගින් අනිවාර්යයෙන්ම සමාන අගයක් ලැබිය යුත්තේ,

(1) සෑම ආර්ථිකයකම සමස්ත නිමැවුම, සමස්ත ආදායම, සමස්ත වියදම යන මේවා ඉබේම සමාන වන බැවිනි.

(2) අගයන් අතර කිසියම් වෙනසක් පවතී නම් ඒවා සංඛ්‍යාත්මක දෝෂ වශයෙන් සැලකෙන බැවිනි.

(3) නිෂ්පාදිතයේ අගය, නිෂ්පාදිතයෙන් බිහිවන ආදායම, නිෂ්පාදිතය මිලට ගැනීමට වැයවන වියදම යන මේවායින් අදහස් වන්නේ එකම දෙයක් බැවිනි.

(4) චක්‍රීය ආදායම් ප්‍රවාහය මගින් මේවා සමාන කරන බැවිනි.

(5) නිෂ්පාදිතයට වඩා ආදායම වැඩි නම් රජය බදු අය කරන බැවිනි.

(45) දළ දේශීය නිමැවුම පිළිබඳ නිවැරදි ප්‍රකාශය වන්නේ,

(1) යම් නිශ්චිත කාල සීමාවක් තුළ රටක පුරවැසියන් බිහිකරනු ලැබූ සමස්ත නිමැවුමේ වටිනාකම යි.

(2) ජාතියක් විසින් බිහිකරනු ලබන භාණ්ඩ හා සේවාවල වටිනාකම යි.

(3) යම් කිසි දේශ සීමාවක් තුළ බිහිවූ ක්ෂය වීම් වලින් පසු ආර්ථිකයට අයත් සම්පත් වලින් ජනනය වූ ආදායම යි.

(4) රටට අයත් භූගෝලීය දේශ සීමාවක් තුළ කිසියම් කාල සීමාවක් තුළදී බිහිවූ සියළුම අවසාන භාණ්ඩ හා සේවාවල වටිනාකම යි.

(5) අවසාන හා අන්තර් භාණ්ඩ වලින් බිහිවූ ක්ෂය වීම් අඩු කිරීමෙන් පසු එකතු කළ වටිනාකම යි.

(46) ජාතික ගිණුම් වලින් ලැබිය හැකි ප්‍රයෝජනයක් නොවන්නේ,

(1) ආර්ථික වෘද්ධිය මිනුම් කිරීම යි.

(2) කාර්ය බද්ධ ආදායම් ව්‍යාප්තිය දැන ගැනීම යි.

(3) ආදායම් ව්‍යාප්තියේ විෂමතා අවබෝධ කර ගැනීම යි.

(4) ආර්ථික ව්‍යුහය හඳුනා ගැනීම යි.

(5) ආර්ථික කළමනාකරණය සඳහා යොදාගත හැකි වීම යි.

(47) දළ දේශීය නිෂ්පාදිතය ගණන් බැලීමේ දී කාර්මික අංශයට ඇතුළත් කරන ආර්ථික කටයුතු දැක්වෙන ප්‍රකාශය තෝරන්න.

(1) සත්ත්ව පාලන කටයුතු, වන ද්‍රව්‍ය, පතල් හා කැනීම්, නිමැවුම් කර්මාන්තය
(2) පතල් හා කැනීම්, ධීවර කර්මාන්තය, නිමැවුම් කර්මාන්තය, විදුලිය, ගෑස් හා ජලය
(3) නිමැවුම් කර්මාන්තය, පතල් හා කැනීම්, විදුලිය, ගෑස් හා ජලය, ඉදිකිරීම්, නිවාස අයිතිය
(4) පතල් හා කැනීම්, නිමැවුම් කර්මාන්තය, ඉදිකිරීම්, බැංකු, රක්ෂණය හා දේපළ වෙළඳාම්
(5) පතල් හා කැනීම්, නිමැවුම් කර්මාන්තය, විදුලිය, ගෑස් හා ජලය, ඉදිකිරීම්

(48) වෙළඳපොළ මිල යටතේ දළ දේශීය නිෂ්පාදිතය සාධක පිරිවැය මිල යටතේ ශුද්ධ ජාතික නිෂ්පාදිතය බවට පත් කිරීම සඳහා අවශ්‍ය ගැලපීම දැක්වෙන ප්‍රකාශය තෝරන්න.

| | ප්‍රාග්ධන ක්ෂයවීම් | විදේශ ශුද්ධ සාධක ආදායම | ශුද්ධ වක්‍ර බදු |
|---|---|---|---|
| (1) | (+) | (-) | (-) |
| (2) | (+) | (-) | (+) |
| (3) | (-) | (+) | (-) |
| (4) | (-) | (+) | (+) |
| (5) | (-) | (-) | (+) |

(49) ජාතික ගිණුම් පිළියෙල කිරීමේ දී පහත සඳහන් කවරක් ඇතුළත් කරනු ලැබේ ද?

(1) තමන් පදිංචිව සිටි නිවස රු. ලක්ෂ 25 කට විකිණීම.
(2) වගා කටයුතු සඳහා ඉඩමක් මිලට ගැනීම.
(3) කොටස් වෙළඳපොළෙන් කොටස් මිලට ගැනීම.
(4) දේපළ සමාගමකින් අළුත් නිවසක් මිලට ගැනීම.
(5) රජයේ භාණ්ඩාගාර බිල්පත් මිලට ගැනීම.

(50) අවසාන නිෂ්පාදිත ක්‍රමය යොදා ගනිමින් රටක දළ දේශීය නිෂ්පාදිතය ගණන් බලන ආකාරය දැක්වෙන නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(1) දළ දේශීය නිෂ්පාදිතය = පාරිභෝජන භාණ්ඩ හා සේවා නිමැවුමේ වටිනාකම + ආයෝජන භාණ්ඩ නිමැවුමේ වටිනාකම

(2) දළ දේශීය නිෂ්පාදිතය = පාරිභෝජන භාණ්ඩ හා සේවා නිමැවුමේ වටිනාකම + ආයෝජන භාණ්ඩ නිමැවුමේ වටිනාකම + අන්තර් භාණ්ඩ තොග වෙනස්වීමේ වටිනාකම + තොග වෙනස්වීමේ වටිනාකම

(3) දළ දේශීය නිෂ්පාදිතය = පාරිභෝජන භාණ්ඩ හා සේවා නිමැවුමේ වටිනාකම + ආයෝජන භාණ්ඩ නිමැවුමේ වටිනාකම - අන්තර් භාණ්ඩ තොග වෙනස්වීම් වටිනාකම.

(4) දළ දේශීය නිෂ්පාදිතය = නිෂ්පාදක සාධක සේවා ආදායම් + ප්‍රාග්ධන භාණ්ඩ ක්ෂය වටිනාකම

(5) දළ දේශීය නිෂ්පාදිතය = පාරිභෝජන භාණ්ඩ හා සේවා නිමැවුමේ වටිනාකම

***

ඩී.එස්. සේනානායක විද්‍යාලය, කොළඹ 07.
D.S. Senanayake College, Colombo 07.

තුන්වන වාර ඇගයීම -2016
Third Term Test - 2016
12 ශ්‍රේණිය
Grade 12

පැය තුන යි.
Three Hours

# ආර්ථික විද්‍යාව - II පත්‍රය
# Economics - II

- යටත් පිරිසයින් එක් කොටසකින් ප්‍රශ්න දෙකක් තෝරාගෙන ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

## "අ" උප කොටස

(01) (1) සම්පත් හිඟකම සහ ආර්ථික භාණ්ඩ අතර පවතින සම්බන්ධතාවය ඔබ පැහැදිලි කරන්නේ කෙසේද? (ලකුණු 4)

(2) නිෂ්පාදන සම්පත් යන්න පැහැදිලි කරන්න. නිෂ්පාදන සම්පත් අතුරින් "දේපල සම්පත්" හා "මානව සම්පත්" ඔබ වෙන් වෙන්ව හඳුනා ගන්නේ කෙසේද? (ලකුණු 4)

(3) ආවස්ථික පිරිවැය සංකල්පය නිර්වචනය කොට එහි ප්‍රායෝගික වැදගත්කම පෙන්වා දෙන්න. (ලකුණු 4)

(4) "සලකා බලන ආර්ථිකයකට නිෂ්පාදන හැකියා මායිම් වක්‍රය මතුපිට ඇති ඕනෑම ලක්‍ෂයයකින් හෝ වක්‍රයට ඇතුළතින් පිහිටි ඕනෑම ලක්‍ෂයයකින් හෝ දැක්වෙන භාණ්ඩ සංයෝගයක් නිෂ්පාදනය කළ හැකි නමුත් නිෂ්පාදන කාර්යක්‍ෂමතාවය අතින් එම ලක්‍ෂ්‍ය එක හා සමාන නොවේ." මෙම ප්‍රකාශය පැහැදිලි කරන්න. (ලකුණු 3)

(5) සිරස් අක්‍ෂයේ කාර්මික භාණ්ඩ ද තිරස් අක්‍ෂයේ කෘෂිකාර්මික භාණ්ඩ ද දැක්වෙන සේ ශ්‍රී ලංකා ආර්ථිකයට අදාළ වැඩිවන ආවස්ථික පිරිවැය සහිත නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයක් යොදා ගනිමින් පහත සඳහන් සිදුවීම් පෙන්නුම් කරන්න.

(අ) ආර්ථිකය අංක දෙකක විරැකියා මට්ටමක් පෙන්නුම් කිරීම.
(ආ) යුද්ධය අවසන් වීමෙන් පසු උතුරු නැගෙනහිර ප්‍රදේශවල වගා කටයුතු නැවත ආරම්භ වීම.
(ඉ) අධි ආරක්‍ෂිත කපාල ලෙස පැවති මුහුදු ප්‍රදේශ යළි ධීවරයින්ට විවෘත වීම.
(ඊ) ඉන්දිය රජය විසින් ශ්‍රී ලංකාවේ ධීවර කර්මාන්තය නගා සිටුවීම සඳහා ට්‍රෝලර් යාත්‍රා 250 ක් ප්‍රදානය කිරීම.
(උ) යුරෝපා සංගමය විසින් පනවා තිබූ මසුන් අපනයන තහනම ඉවත් කිරීම. (ලකුණු 5)

(02) (1) "වෙළඳපොළ ආර්ථික පද්ධතියක නිෂ්පාදකයින්, පාරිභෝගිකයින් හා සාධක හිමියන් මෙහෙයවනු ලබන අභිප්‍රේරණ සාධකය ස්වාර්ථය යි." මෙම ප්‍රකාශය පැහැදිලි කරන්න. (ලකුණු 4)

(2) නිදහස් වෙළඳපොළ ආර්ථික පද්ධතියකට ආණ්ඩුවේ මැදිහත්වීම සාධාරණීය කළ හැක්කේ කවර හේතු නිසා ද? (ලකුණු 4)

(3) "ප්‍රාග්ධනය" සහ "මානව ප්‍රාග්ධනය" අතර පවතින සම්බන්ධතාවය පැහැදිලි කරන්න. (ලකුණු 3)

(4) "වෙළඳපොළ ආර්ථික පද්ධතිවල ලාභයට අයත් කාර්ය භාරයක් පැවතුනා ද, මධ්‍යගත සැලසුම් ආර්ථික පද්ධතිවලි ලාභයට අයත් කාර්ය භාරයක් නැත." මෙම ප්‍රකාශයට ඔබ එකඟ වන්නේ ද? පිළිතුරු පැහැදිලි කරන්න. (ලකුණු 4)

(5) ඕනෑම වෙළඳපොළ ආර්ථික පද්ධතියක මධ්‍යගත සැලසුම් ආර්ථිකයක ලක්‍ෂණ ද මිශ්‍රව පවතින අතර, ඕනෑම මධ්‍යගත සැලසුම් ආර්ථිකයක වෙළඳපොළ ආර්ථික ලක්‍ෂණ ද මිශ්‍රව පවතී. එම නිසා ඕනෑම වෙළඳපොළ ආර්ථියක් හෝ මධ්‍යගත සැලසුම් ආර්ථිකයක් අවශ්‍යයෙන්ම මිශ්‍ර ආර්ථිකයක් වන්නේ ද? ඔබේ පිළිතුර පැහැදිලි කරන්න. (ලකුණු 5)

(03) X භාණ්ඩය සඳහා A, B හා C යනුවෙන් පාරිභෝගිකයින් තිදෙනෙකු පමණක් වෙළඳපොළේ සිටිතැයි ද ඔවුන්ගේ පෞද්ගලික ඉල්ලුම් ශ්‍රිත පහත දැක්වෙන පිරිදි වේ යැයි ද සිතන්න.

$$Qd_A = 250 - 5P$$

$$Qd_B = 150 - 3P$$

$$Qd_C = 100 - 2P$$

මෙම වෙළඳපොළේ එක සමාන සැපයුම් ශ්‍රිතයකට මුහුණ දෙන සැපයුම්කරුවන්ගේ 5 දෙනෙකු පමණක් සිටින අතර එම එක් එක් සැපයුම්කරුවෙකුගේ සැපයුම් ශ්‍රිතය පහත දැක්වේ.

$$Qs = 20 + 2P$$

(අ) (1) වෙළඳපොළ ඉල්ලුම් ශ්‍රිතය සහ වෙළඳපොළ සැපයුම් ශ්‍රිතය ව්‍යුත්පන්න කරන්න. (ලකුණු 2)

(2) ඉල්ලුම් සහ සැපයුම් වක්‍ර ප්‍රස්ථාර සටහනක ඇඳ සමතුලිත මිල හා ප්‍රමාණය පෙන්වන්න. (ලකුණු 2)

(3) සමීකරණ භාවිතයෙන් මෙම භාණ්ඩයේ වෙළඳපොළ සමතුලිත මිල හා ප්‍රමාණය ගණනය කරන්න. (ලකුණු 2)

(ආ) රජය මෙම භාණ්ඩයේ සැපයුම්කරුවන් මත ඒකකයකට රු.10 බැගින් වූ බද්දක් පැනවූයේ යැයි සිතන්න.

(1) බද්ද පැනවීමෙන් පසු වෙළඳපොළ සැපයුම් වක්‍රයටත්, වෙළඳපොළ සැපයුම් ශ්‍රිතයටත් ඇතිවන බලපෑම පෙන්වන්න. (ලකුණු 2)

(2) ප්‍රස්ථාර සටහන හා සමීකරණ යන දෙයාකාරයම භාවිතයෙන් බද්දට පසු සමතුලිත මිල හා ප්‍රමාණය පෙන්වන්න. (ලකුණු 2)

(3) රජයට ලැබෙන මුළු බදු අයභාරය කොපමණ ද? (ලකුණු 2)

(4) රජයට ලැබෙන මුළු බදු අය භාරයට පාරිභෝගික හා නිෂ්පාදන යන දෙපාර්ශවය කොපමණ ප්‍රමාණ වලින් දායක වේද? (ලකුණු 2)

(5) පාරිභෝගිකයින් උසුලන මුළු බදු බර A, B හා C යන පාරිභෝගිකයින් තිදෙනා අතර බෙදී ගොස් ඇත්තේ කෙසේද? (ලකුණු 3)

(6) නිෂ්පාදකයින් උසුලන මුළු බදු බර එක් එක් සැපයුම්කරුවන් අතර බෙදී ගොස් ඇත්තේ කෙසේද? (ලකුණු 3)

(04) (1) භාණ්ඩයක වෙළඳපොළ ඉල්ලුම් වක්‍රය හා සැපයුම් වක්‍රය සරල රේඛා මගින් දැක්වේ යැයි සිතන්න. පහත දැක්වෙන තොරතුරු ද ඔබට සපයා ඇත.

භාණ්ඩයේ උපරිම ඉල්ලුම් මිල රු. 50 කි.

සැපයුම් වක්‍රයේ අන්ත : ඛණ්ඩය රු. -10 කි.

මිල රු.20 දී මිල ඉල්ලුම් නම්‍යතාවය සහ සැපයුම් නම්‍යතාවය ගණන බලන්න. (ලකුණු 4)

(2) ගිෆන් භාණ්ඩයක්, බාල භාණ්ඩයකින් කෙසේ වෙනස්වේදැයි ප්‍රස්ථාර සටහන් යොදා ගනිමින් පැහැදිලි කරන්න. (ලකුණු 4)

(3) භාණ්ඩයක ඉල්ලුම හා ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණය අතර වෙනස පැහැදිලි කරන්න. (ලකුණු 4)

(4) (අ) X භාණ්ඩයේ මිල ඉල්ලුම් නම්‍යතාවය -1.5 ක්ද, සැපයුම් නම්‍යතාවය 1 ක් ද වේ. රජය මෙම භාණ්ඩයේ ඒකකයක් මත රු.10 ක බද්දක් පනවනු ලැබුවහොත් අපේක්ෂිත මිල ඉහළ යෑම කොපමණ ද? (ලකුණු 2)

(ආ) Y භාණ්ඩය සඳහා පවතින මිල ඉල්ලුම් නම්‍යතාවය -0.8 කි. ආයතනය Y භාණ්ඩයේ මිල 30% කින් ඉහළ නැංවීමට අපේක්ෂා කරයි නම් ඉල්ලුම් ප්‍රමාණයේ කවර වෙනසක් අපේක්ෂා කළ හැකිද? (ලකුණු 2)

(5) ලූනු සඳහා වෙළඳපොළේ පවතින ඉල්ලුම කෙබඳුවේද? එවැනි ඉල්ලුමක් පැවතිමට බලපෑ සාධක හඳුනා ගන්න. (ලකුණු 4)

## "ආ" උප කොටස

(05) (1) තරගකාරී වෙළඳපොළක අලෙවි වන භාණ්ඩයක් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| මිල රු. | ඉල්ලුම් ප්‍රමාණය (ඒකක) | අධි සැපයුම් ප්‍රමාණය (ඒකක) |
|---|---|---|
| 20.00 | 20 | 100 |
| 4.00 | 120 | -100 |

රජය මෙම භාණ්ඩයේ ඒකකයක් සඳහා රු.16/- ක සහතික මිලක් තීරණය කර අතිරික්ත සැපයුම මිලට ගැනීමේ මිල ආධාරක ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කරනවාද? නැතහොත් ඌණ පූර්ණ ගෙවීමේ මිල ආධාරක ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කරනවාද? යන්න පිළිබඳව විමසමින් සිටී. මේ පිළිබඳව තීරණයක් ගැනීමට ඔබව පත් කළහොත් ඔබ විසින් තෝරා ගනු ලබන ප්‍රශස්ත මිල ආධාරක ප්‍රතිපත්තිය අදාළ නිර්දේශ සහිතව පැහැදිලි කරන්න. ඒ සඳහා කරනු ලබන ගණන් බැලීම් ද ඉදිරිපත් කරන්න. (ලකුණු 5)

(2) භාණ්ඩයක සැපයුම් නම්‍යතාවය තීරණය වීමට බලපාන සාධක කවරේද? (ලකුණු 3)

(3) X, Y හා Z යනු එකිනෙකට ආදේශ කළ හැකි භාණ්ඩ තුනකි. X හා Y අතර හරස් මිල ඉල්ලුම් නම්‍යතාවය + 0.025 ක් වන අතර X හා Z අතර හරස් මිල ඉල්ලුම් නම්‍යතාවය +1.25 කි. අනාගතයේදී ශ භාණ්ඩයේ මිල 50% කින්ද, Z භාණ්ඩයේ මිල 10% කින්ද අඩු කිරීමට යන බව X භාණ්ඩය නිපදවන ආයතනය රහසිගතව දැනගනී. X භාණ්ඩය නිපදවන ආයතනයට වඩාත්ම තර්ජනයක් ඇත්තේ කවර භාණ්ඩයකින් ද යන්න අදාළ ගණන් බැලීම් සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 4)

(4) පහතට බෑවුම් වන සරල රේඛීය ඉල්ලුම් වක්‍රයක මිල ඉල්ලුම් නම්‍යතාවය අපිරිමිතයේ සිට ශුන්‍ය දක්වා ලක්ෂ්‍යයෙන් ලක්ෂ්‍යයට වෙනස් වීමට බලපාන ගණිත සිද්ධාන්තය පැහැදිලි කරන්න. (ලකුණු 4)

(5) සමතුලිත හුවමාරුවේ දී හට ගන්නා ආර්ථික අතිරික්තය සහ සංකල්පය ප්‍රස්තාර සටහනක් ඇසුරෙන් පැහැදිලි කර එම සංකල්පයේ වැදගත්කම පෙන්වා දෙන්න. (ලකුණු 4)

(06) (1) නිෂ්පාදන ක්‍රියාවලියේ දී යොදා ගැනෙන කෙටි කාලය හා දිගු කාලය යන සංකල්ප අතර වෙනස පැහැදිලි කර කෙටි කාලීන නිෂ්පාදන ශ්‍රිතය හා දිගු කාලීන නිෂ්පාදන ශ්‍රිතය ලියා දක්වන්න. (ලකුණු 4)

(2) හීනවන ඵලදායිතා නිතිය හා අඩුවන පරිමාණානුකූල ඵල නිතිය අතර වෙනස පැහැදිලි කරන්න. (ලකුණු 4)

(3) කෙටිකාලීන නිෂ්පාදන ක්‍රියාවලියේ දී ආයතනයක සාමාන්‍ය නිෂ්පාදිතය සහ ආන්තික නිෂ්පාදිතය හැසිරෙන ආකෘතිය ප්‍රස්තාර සටහනක් මගින් ඉදිරිපත් කරන්න. එමගින් ලැබිය හැකි වැදගත් නිගමන කවරේද? (ලකුණු 4)

(4) "නිෂ්පාදන ක්‍රියාවලියක දී හට ගන්නා පෞද්ගලික පිරිවැය පමණක් ගණනය කිරීම තුළින් නිෂ්පාදනයේ සැබෑ පිරිවැය හඳුනා ගත නොහැක." නිදසුන් දෙමින් මෙම ප්‍රකාශය පැහැදිලි කරන්න. (ලකුණු 5)

(5) "ආර්ථික ලාභ" යන සංකල්පයෙන් කුමක් අදහස් වේද? නිදහස් වෙළඳපොළ ආර්ථිකයක් තුළ එහි වැදගත්කම පැහැදිලි කරන්න. (ලකුණු 3)

(07) (1) වෙළඳපොළ ව්‍යුහය යන සංකල්පයෙන් කුමක් අදහස් වේද? වෙළඳපොළ ව්‍යුහයන් වර්ග කිරීමට යොදා ගන්නා ප්‍රධාන නිර්ණායක කවරේද? (ලකුණු 4)

(2) ශ්‍රී ලංකාවේ දක්නට ලැබෙන පහත සඳහන් කර්මාන්ත ප්‍රධාන වෙළඳපොළ ආකෘති අතුරින් කවරකට අයත් වේද? යන්න හඳුනාගෙන එම වෙළඳපොළ ආකෘති අතර පවතින ප්‍රධාන වෙනස්කම් තුනක් පැහැදිලි කරන්න.

(අ) ආපන ශාලා (2) පොල් (ලකුණු 5)

(3) ඒකාධිකාරයේ දී නව සැපයුම්කරුවන්ට කර්මාන්තයට ප්‍රවේශ වීමේ දී මුහුණ දීමට සිදුවන බාධක කවරේද? (ලකුණු 3)

(4) මුල්‍ය වැටුප හා මූර්ත වැටුප අතර වෙනස පැහැදිලි කර මූර්ත වැටුප් වල වැදගත්කම පෙන්වා දෙන්න. (ලකුණු 4)

(5) පහත සඳහන් තොරතුරු ඔබට සපයා ඇත.

| | | |
|---|---|---|
| 2015 දෙසැම්බර් ශ්‍රමිකයෙකුගේ මුල්‍ය වැටුප | | රු. 10000 |
| 2015 දෙසැම්බර් පාරිභෝගික මිල දර්ශකය | (2000 = 100) | 500 |
| 2015 දෙසැම්බර් උද්ධමන අනුපාතිකය | | 12% |
| 2015 දෙසැම්බර් නාමික පොළී අනුපාතිකය | | 10% |

ඉහත තොරතුරු ඇසුරෙන් මතු දැක්වෙන ගණනය කරන්න.

(අ) මූර්ත වැටුප (ආ) මූර්ත පොළී අනුපාතිකය (ලකුණු 4)

(08) (1) රටක දළ දේශීය නිෂ්පාදිතය ගණන බැලීමේ දී හටගත හැකි ද්විගණන දෝෂ හෝ ඔහු ගණන දෝෂ යනුවෙන් කුමක් අදහස් වේද? යන්න නිදසුනක් යොදා ගනිමින් පැහැදිලි කරන්න. (ලකුණු 4)

(2) "එකතු කළ 'වටිනාකම් ක්‍රමය" මින් කුමක් අදහස් වේද? ද්විගණන දෝෂ හා ඔහු ගණන දෝෂ වළක්වා ගැනීම සඳහා එකතු කළ වටිනාකම් ක්‍රමය යොදාගත හැකි ආකාරය ඔබගේම සංඛ්‍යා ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 4)

(3) ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතය ඇස්තමේන්තු කිරීමේ දී සේවා අංශයට ඇතුළත් කරන නිශ්චිත ආර්ථික කටයුතු කවරේද? (ලකුණු 4)

(4) ස්ථාවර මිලට ගණනය කරන ලබන දළ දේශීය නිෂ්පාදිතය යනුවෙන් කුමක් අදහස් වේද? දළ දේශීය නිෂ්පාදිතය ස්ථාවර මිලට ගණන් බැලීමේ වැදගත්කම පැහැදිලි කරන්න. (ලකුණු 4)

(5) ආර්ථික වර්ධන අනුපාතිකය නිර්වචනය කොට එය ගණන් බලන ආකාරය පෙන්වන්න. (ලකුණු 4)

***